චක්‍රලේඛ අංක:- 10/2005

034

මගේ අංකය:-බ.ප./ස.සේ.කො./පරිපාටි
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
අංක: 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08
2005.06.09

සියළුම විවිධ සේවා සමූපකාර සමිති,
සභාපති වරුන්,ස.ණ.ස. සහ
ග්‍රාමීය බැංකු සංගම්
සභාපතිවරුන් වෙත.

අනුමත තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා
සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති
රෙජිස්ට්‍රාර් (බ.ප.) අනුමැතිය ලබා ගැනීම.

දැනට ක්‍රියාත්මක වන අන්දමට අනුමත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.) අනුමැතිය ලබා ගැනීම අවශ්‍යව ඇත.

එහෙත් සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.) සමඟ කරන ලද සාකච්ඡාවේදී, අවුරුදු 03 කට මෙපිට අනුමතකර ඇති පිරිස්බල තක්සේරුවේ සඳහන් තනතුරු සම්පූර්ණ කිරීම සඳහා සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)ගේ අනුමැතිය අනවශ්‍ය බව තීරණය කෙරිණි.

ඊට සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.) පූර්ණ එකඟතාවය ලැබුන අතර, මින් ඉදිරියට අනුමත තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී ඉහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කිරීමට සටයන් කර ගන්නා ලෙස මෙයින් දැනුම් දෙමි.

මීට පෙර මේ සම්බන්ධව සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.) නිකුත්කර ඇති උපදෙස් මෙයින් සංශෝධනය කෙරේ.

ජේ.කේ.සිරිසේන,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:-
1. බස්නාහිර පළාත් සමූපකාර-ප්‍රවාහන මාර්ග හා විදුලි බල අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම් - සමූපකාර,පළාත් මාර්ග හා විදුලි බල අමාත්‍යාංශය(බ.ප.)
4. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ,කළුතර, ගම්පහ)
6. ලේකම් - සමූපකාර සේවක කොමිෂන් සභාව
7. සියළුම පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව ලේකම්වරුන්
8. සියළුම වෘත්තීය සමිති.